# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2465/11 - 2025 දෙසැම්බර් මස 03 වැනි බදාදා - 2025.12.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 21/78(XV)(ඩී)

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

21 වැනි වගන්තිය සමග කියවිය යුතු 27(1) වැනි වගන්තිය යටතේ වූ නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 21 වැනි වගන්තිය සමග කියවිය යුතු 27(1) වැනි වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍ය හරිනි අමරසූරිය වන මා විසින්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය මත, මේ නියමය මගින්, (කලින් කලට සංශෝධිත පරිදි වූ) 1986 සැප්තැම්බර් මස 26 වැනි දින අංක 420/25 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද ශ්‍රී ලංකාවේ නැගෙනහිර විශ්වවිද්‍යාලයේ පීඨයන් සහ අධ්‍යනාංශයන් නිශ්චිතව දක්වන ලද උපලේඛනයේ I වන තීරයේ (2007 නොවැම්බර් මස 14 වැනි දින අංක 1523/16 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමයේ නිශ්චිතව දක්වා ඇති) "කලා හා සංස්කෘතික කටයුතු පීඨය" යන අයිතමය සහ එම උපලේඛනයේ II වන තීරයේ ඇති අනුරූප සටහන් ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් එම උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

| *I වැනි තීරය*<br>*පීඨය* | *II වැනි තීරය*<br>*අධ්‍යයනාංශය* |
|---|---|
| කලා හා සංස්කෘතික කටයුතු පීඨය | 1. අරාබි භාෂා අධ්‍යයනාංශය |
| | 2. ඉස්ලාමීය අධ්‍යයනාංශය |
| | 3. ලලිත කලා අධ්‍යයනාංශය |
| | 4. භූගෝල විද්‍යා අධ්‍යයනාංශය |


1A - PG 7378 - 329 (2025/12)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

| *I වැනි තීරය* *පීඨය* | *II වැනි තීරය* *අධ්‍යයනාංශය* |
|---|---|
| කලා හා සංස්කෘතික කටයුතු පීඨය | 5. භාෂා අධ්‍යයනාංශය |
| | 6. අධ්‍යාපන හා ළමා සුරැකුම් අධ්‍යයනාංශය |
| | 7. තුලනාත්මක ආගම් සහ සමාජ සුසංයෝග අධ්‍යයනාංශය |
| | 8. ඉතිහාසය අධ්‍යයනාංශය |
| | 9. හින්දු ශිෂ්ටාචාර අධ්‍යයනාංශය |
| | 10. දර්ශන හා ඇගයුම් අධ්‍යයනාංශය |
| | 11. ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ අධ්‍යයනාංශය |
| | 12. දෙමළ අධ්‍යයන අධ්‍යයනාංශය |
| | 13. තොරතුරු තාක්ෂණ අධ්‍යයනාංශය |
| | 14. ආර්ථික විද්‍යා සහ සංඛ්‍යාන අධ්‍යයනාංශය |
| | 15. සමාජීය විද්‍යා අධ්‍යයනාංශය |
| | 16. සමාජ විද්‍යා හා මානව විද්‍යා අධ්‍යයනාංශය |

**හරිනි අමරසූරිය,**
අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ
වෘත්තීය අධ්‍යාපන අමාත්‍ය.

2025 නොවැම්බර් මස 19 වැනි දින,
කොළඹ දී ය.

EOG 12 - 0011

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.